වෙනත් පුද්ගලයන් හා බෞද්ධ සමාගම් මගින් පාලනය කරන ලද පාසැල්වලට ද කුලරත්න මැතිඳුන්ගේ උපකාරය බලාපොරොත්තුවන්නට වන. පානදුරේ ශ්‍රී සුමංගල විද්‍යාලයේ හා මොරටු විද්‍යාලයේත් පාලනය කුලරත්න මැති තුමාට පැවරිණ. වරක් ධර්මරාජ විද්‍යාලයේ ද ප්‍රධානත්‍වය දැරුවේ ය. බෞද්ධ පාඨශාලා සාමාන්‍යාධිකාරි ධුරයත් කීප වරක් ම මෙ තුමාට පැවරිණ. ඇතැම් විට එහි නිලධාරීන් තේරීමේදී පැවැති අයථා ක්‍රම නිසා මෙ තුමාට සාමාන්‍යාධිකාරි ධුරයෙන් ඉවත් වන්නට සිදුවුණි. එහෙත් මෙ තුමා ඉවත් ව සිටි ටික කාලයේදී පාසැල් පාලනය අවුල් ජාලයක් ව තිබිණ. රජකුගෙන් ඉටුවිය යුතු කාර්‍ය්‍යයක් අදිකාරම් කෙනෙකුගෙන් කෙසේ බලාපොරොත්තු විය හැකි ද?

බෞද්ධ අධ්‍යාපනය පමණක් නොව අමද්‍යප ව්‍යාපාරය, අපරාධ මර්දනය ආදී පොදුජන ප්‍රශ්නයන්හිදී ද, දේශපාලනයෙහි ද උසස් තැනක් ගත් කුලරත්න මැති තුමා අනෙක් ජන නායකයන් සමග උරෙනුර ගැටී සහයෝග-යෙන් ක්‍රියා කෙළේ ය. වරක් රාජ්‍ය මන්ත්‍රීවරයෙක් ව සිටි මෙ තුමා දැන් අම්බලන්ගොඩ කොට්ඨාශය වෙනුවෙන් පාර්ලිමේන්තුවෙහි පෙනී සිටී. බෞද්ධ කොමිෂන් සභාවේ ද සභාපති ධුරය දැරූ මෙ තුමා බෞද්ධ අධ්‍යාපනය අතින් ගත්තේ මුල් තැනකි. කිසිවකුට නොදෙවැනි තැනකි.

---

## ඇල්. එච්. මෙත්තානන්ද මැති තුමා

ශාස්ත්‍රාචාර්‍ය්‍ය මෙත්තානන්ද මහතාගේ නාම ය නොදන්නා සිංහලයෙක් ලක්දිව නැත. ආනන්ද මහා විද්‍යාලයෙහි හා ධර්මරාජ විද්‍යාලයෙහිත් ප්‍රධානත්‍වය දරමින් බෞද්ධ අධ්‍යාපනයට අමරණීය සේවයක් කළ මෙ තුමා වඩාත් ප්‍රසිද්ධියට පැමිණියේ සිංහල රට, සිංහල භාෂාව,



බෞද්ධයාගේ අයිතිවාසිකම් ආදී කරුණු ගැන මහ සටනක යෙදීමෙන් පසු ය. මේ රට සිංහලයාගේ ය. සිංහලයාට තමාගේය යි කිව හැකි අන් රටක් මෙය හැර නැත. රටේ වැඩි දෙනා සිංහලයෝ ය. සියයට හැත්තෑපහකටත් වඩා සිංහලයෝ ය. එහෙයින් ප්‍රජාතන්ත්‍රවාදය අනුව මේ රටේ රාජ්‍ය භාෂාව සිංහලය විය යුතු ය. රටේ වැඩි පිරිස බෞද්ධයන් නිසා නිලතල අතින් බෞද්ධයන්ට දැන් තිබෙනවාට වඩා වැඩි බලයක් තිබිය යුතුය. යනාදි තර්ක ගෙන හැර පාමින් මෙ තුමා දිවා රෑ දෙක්හි ප්‍රබල සටනක යෙදී සිටී.

බණ්ඩාරනායක රජය පිහිටුවීමට අන් හැම කෙනෙ-
කුන්ට ම වඩා වෙහෙස වූ කෙනෙකි මෙත්තානන්ද මහත්මා.
ප්‍රසිද්ධ කථා මාර්ගයෙන් ද වේගවත් ලිපිවලින් ද කලින්
පැවති පාලන බලයට විරුද්ධව ප්‍රබල සටනක් ගෙන ගියේ
මෙ තුමා ය. එහෙත් නව රජයේ නිලතල කිසිවක් මෙ තුමා
පිළි නොගත්තේ ය. සිය අදහස් හරි හෝ වේවා, වැරදි
හෝ වේවා, ඒවා ක්‍රියාත්මක කිරීමට අප්‍රතිහත ධෛර්‍ය-
යෙන් යුක්තව මෙ තුමා ඉදිරිපත් වෙයි. ඉකුත් හතළිස්
වස තුළ ලංකාවේ ජාතික වූ ද, ආගමික වූ ද සකල සත්
ව්‍යාපාරයකට ම සහයෝගය දුන් මෙත්තානන්ද මහත්මා
ර්යේ මෙන් අදත්, අද මෙන් හෙටත් සිය සටන ගෙන යයි
බහු ජනතාව උදෙසා සිංහල ජාතික සටන මෙහෙයවයි.